# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 16 දරන ජනලේඛන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 මාර්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 65 යි　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1981 අංක 16 දරන ජනලේඛන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 80/79.

**ජනලේඛන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 1981 අංක 16 දරන ජනලේඛන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

143 වන අධිකාරයේ 2 වන සහ 3 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජනලේඛන ආඥාපනතේ 2 වන සහ 3 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :—

' ජනලේඛනය ගැනීම අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු බව.

2. ශ්‍රී ලංකා වාසීන්ගේ ප්‍රජා විද්‍යාත්මක, සමාජීය හෝ ආර්ථික තත්වය නිශ්චය කිරීම සඳහා ජන ගහණය, නිවාස, කෘෂිකර්මය, පශු සම්පත, වෙළෙඳාම, කම්කරුවන්, කර්මාන්ත හෝ වාණිජ්‍යය හෝ අමාත්‍යවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් එවැනි කරුණු පිළිබඳව ජනලේඛන යක් ගත යුතු යයි අමාත්‍යවරයා විසින් කලින් කල ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියෝගයක් මගින් නියම කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

ජනලේඛන අධිකාරි වරයකු පත් කිරීම.

3. යම් ජනලේඛනයක් ගැනීම අධීක්ෂණය කරනු සඳහා "ජනලේඛන අධිකාරි" යනුවෙන් නම් කෙරෙන නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය. ජනලේඛන අධිකාරි ධුරයට පත් කිරීමක් කරනු නොලැබුවහොත් සංඛ්‍යාලේඛන ආඥාපනත යටතේ පත් කරනු ලැබූ සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂවරයා, ජනලේඛන අධිකාරිවරයා ලෙස සලකනු ලැබිය යුතු අතර මේ ආඥාපනත මගින් ජනලේඛන අධිකාරිවරයාට පවරන ලද හෝ නියම කරන ලද බලතල, කාර්ය සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම ඔහු විසින් කළ යුතු ය.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) ගැසට් පත්‍රයේ නිකුත් කිරීම් දෙකක රීති පළ කළ යුතු අතර එසේ අවසන් වරට ප්‍රසිද්ධ කෙරෙන දිනයේ සිට ඒවා බලාත්මක විය යුතු අතර අධිකරණ පිළිගැනීම ලැබිය යුතු ය.

(4) එවැනි යම් රීතියක් කඩ කරන්නා වූ යම් තැනැත්තකු මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ වරදකරු කරනු ලැබීමෙන් පසු එක් මාසයක් නොඉක්මවන්නා වූ කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල්

එක් දඟයක් නොඉක්මවන්නා වූ දඬයකට හෝ ඒ දඬය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" දිසාපති සහ නගරාධිපති, සභාපති හෝ විශේෂ කොමසාරිස්, මහ නගර සභාවක, නගර සභාවක හෝ සුළු නගර සභාවක කොමසාරිස් වරුන් විය යුතු බව.

6. පරිපාලන දිස්ත්‍රික්කයක දිසාපතිවරයා ඔහුගේ දිස්ත්‍රික්කයේ ජනලේඛන කොමසාරිස්වරයා විය යුතු අතර සෑම මහ නගර සභාවක, නගර සභාවක, සුළු නගර සභාවක, නගරාධිපතිවරයා, සභාපතිවරයා හෝ යම් පළාත් පාලන ආයතනයක් විශේෂ කොමසාරිස්වරයකු විසින් පාලනය කරනු ලබන අවස්ථාවක දී එකී විශේෂ කොමසාරිස්වරයා, එකී මහ නගර සභාවට, නගර සභාවට සහ සුළු නගර සභාවට අයත් බල ප්‍රදේශයේ ජනලේඛන කොමසාරිස්වරයා විය යුතු ය :

එසේ වුවද ඒ දිස්ත්‍රික්කය හෝ මහ නගර සභාව හෝ නගර සභාව හෝ සුළු නගර සභාව වෙනුවෙන් කොමසාරිස්වරයා ලෙස වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන, 9 වන සහ 10 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන, 9 වන සහ 10 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :—

" ගණන් ගන්නන්, අධීක්ෂකයන් සහ ප්‍රධාන අධීක්ෂකයන් බඳවා ගැනීම.

8. කොමසාරිස්වරයා විසින් යම් නිශ්චිත ප්‍රදේශයක ජනලේඛනය ගැනීමට හෝ ජනලේඛනය ගැනීමට ආධාර පිණිස හෝ ජනලේඛනය ගැනීම, අධීක්ෂණය කිරීමට අවශ්‍යාවෝචිත පරිදි ගණන් ගන්නකු, අධීක්ෂකයකු හෝ ප්‍රධාන අධීක්ෂකයකු වශයෙන් යම් තැනැත්තකු ලිඛිතව බඳවා ගත හැකි අතර ඕනෑම අවස්ථාවක එකී තැනැත්තා එයින් මුදා හළ හැකි ය.

ජනලේඛන නිලධරයන් වන්නේ කවුරුන් ද යන වග.

9. මේ ආඥාපනතේ ඉහතින් වූ විධිවිධානවල දක්වා ඇති අධිකාරිවරයා සහ සෑම නියෝජ්‍ය අධිකාරිවරයෙක්, සහකාර අධිකාරිවරයෙක්, කොමසාරිස් වරයෙක්, උප කොමසාරිස්වරයෙක්, ප්‍රධාන අධීක්ෂකයෙක්, අධීක්ෂකයෙක් සහ ගණන් ගන්නෙක්ම මේ ආඥාපනතේ අර්ථානුකූලව ජනලේඛන නිලධරයකු විය යුතු අතර දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ නිලධරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

ඇතුල්වීමට ඉඩ දිය යුතු මෙන් ම අංක ඇලවීමට පදිංචිකරු අවසර දිය යුතු බව.

10. යම් ඉඩමක, ගොඩනැගිල්ලක, නිවසක, ආවෘත ස්ථානයක, යාත්‍රාවක හෝ වෙනත් ස්ථානයක පදිංචි වී සිටින සෑම තැනැත්තකුම යම් ජනලේඛන නිලධරයකුට එකී ජනලේඛනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි, රටේ චාරිත්‍රවලට අනුව යුක්ති සහගත වූ ඇතුල් වීමකට ඉඩ දිය යුතු අතර එවැනි තැනැත්තකු පදිංචි වී ඇති දේපළක හෝ ඒ මත ජනලේඛනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි යම් අකුරු, ලකුණු හෝ අංක පින්තාරු කිරීමට, ලකුණු කිරීමට හෝ ඇලවීමට ඉඩ දිය යුතු ය. ".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

" උපලේඛන, වාසස්ථාන හෝ ආයතනවල තැබිය යුතු අතර ඒවා ගෘහමූලිකයා හෝ ආයතනය භාර තැනැත්තා විසින් පිරවිය යුතු බව.

13. (1) අමාත්‍යවරයා විසින් මේ සම්බන්ධයෙන් සෑදිය හැකි යම් රීතිවලට යටත්ව යම් ජනලේඛන නිලධරයකු විසින් සිය බල ප්‍රදේශය තුළ පිහිටි වාසස්ථානයක හෝ යම් ආයතනයක හෝ ඒ වාසස්ථානයේ නැතහොත් ආයතනයේ යම් නිශ්චිත කොටසක ගෘහමූලිකයා විසින් හෝ එය භාර තැනැත්තා විසින් හෝ එවැනි තැනැත්තකු නොමැති අවස්ථාවක දී එකී නිවසේ හෝ ආයතනයේ හෝ එහි එකී නිශ්චිත කොටසේ වගකිව යුතු සාමාජිකයකු විසින් පුරවනු ලැබීම සඳහා අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබ ඇති ආකෘතිය අනුව වූ උපලේඛනයක් එකී වාසස්ථානයේ හෝ ආයතනයේ තබා යෑම හෝ තබා යෑමට සැලැස්වීම හෝ කළ හැකි ය.

(2) එවැනි යම් උපලේඛනයක් තබා ගොස් ඇති අවස්ථාවක දී වාසස්ථානයේ ගෘහමූලිකයා හෝ ආයතනය භාර තැනැත්තා හෝ එය අදාළ වන්නා වූ කොටස් භාර තැනැත්තා විසින් සිය උපරිම දැනුම හා විශ්වාසය අනුව එය පුරවා හෝ පිරවීමට සලස්වා ඒ සඳහා විධිවිධාන සලසා ඇත්නම් ඒ ස්ථානයේ සිය නම අත්සන් කර එසේ පුරවා අත්සන් කළ උපලේඛනය එසේ නියම කර ඇති අවස්ථාවක වාසස්ථානය හෝ ආයතනය පිහිටි ප්‍රදේශය සඳහා පත් කර ඇති අධීක්ෂකට හෝ ගණන් ගන්නාට හෝ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි වූ වෙනත් තැනැත්තකුට භාර දිය යුතු ය. ".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (2) (1) වන උපවගන්තිය යටතේ උපලේඛනය හෝ උපලේඛන භාර දෙනු ලැබූ තැනැත්තා එම උපවගන්තියෙන් නියම කරනු ලැබ ඇති කරුණු සිය උපරිම දැනුම හා විශ්වාසය අනුව

පිරවීමට සලස්වා එහි ඒ සඳහා විධිවිධාන සලසා ඇත් නම් නියමිත ස්ථානයේ සිය නම අත්සන් කර එසේ පුරවා අත්සන් කළ උප ලේඛනය හෝ උපලේඛන එසේ නියමකර ඇති අවස්ථාවක ඒ ප්‍රදේශය සඳහා පත්කර ඇති ගණන් ගන්නාට හෝ අධීක්ෂකට හෝ ඒ ප්‍රදේශය භාර කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි වූ වෙනත් තැනැත්තකුට හෝ ඒ ප්‍රදේශයේ ජනලේඛන අධිකාරිවරයා හෝ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි වූ වෙනත් ක්‍රමයකින් හෝ භාර දෙනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" නාවුක හමුදා, යුද්ධ හමුදා හෝ ගුවන් හමුදා සහ දේශාටකයන්, සංචාරකයන් ආදීන් ගණන් ගැනීම.

15. මේ පනතින් හෝ අමාත්‍යවරයා විසින් සාදන ලද රීතිවලින් හෝ ලබා ගත යුතු යයි නියම වී ඇති—

(අ) ශ්‍රී ලංකා නාවුක හමුදාවට, යුද්ධ හමුදාවට හෝ ගුවන් හමුදාවට හෝ යම් යුද්ධ නෞකාවකට අයත් වන්නා වූ මිනිසුන් සමූහයකට, සහ

(ආ) යම් ජනලේඛනයක් ගැනීමට නියමිත කාලය තුළ දී සංචාරයේ යෙදී සිටින හෝ නැවක් තුළ සිටින හෝ වෙනත් කිසියම් හේතුවක් නිසා ඉහත සඳහන් පරිදි ජන ලේඛන නිලධරයන් විසින් ගණන් ගනු ලැබීමට නියමිත යම් නිවසක් තුළ නො සිටින තැනැත්තන්ට,

අදාළ තොරතුරු ජනලේඛන අධිකාරිවරයා විසින් එකී තොරතුරු ලබා ගැනීම සඳහා ඉතාම සුදුසු යයි තමාට පෙනී යන කවර හෝ මාර්ග සහ විධි මගින් ලබා ගත යුතු අතර මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි ඔහු විසින් සෑදිය යුතු වන සංක්ෂේප සටහනේ ඒ තොරතුරු ඇතුළත් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" වාර වාර්තා සැපයීම කම්කරු සේවා යෝජක යන්ගේ කාර්ය බව.

17. (1) යම් ආකරයක හෝ ගල්වළක හෝ යම් කර්මාන්ත ශාලාවක, වැඩපොළක හෝ වෙනත් වෙළෙඳ හෝ කාර්මික ආයතනයක සේවා නියුක්ත යන් පස් දෙනකු හෝ ඊට වැඩි ගණනක් භාරව සිටින සෑම සේවායෝජකයකු හෝ තැනැත්තකුම එකී ආකරයේ, ගල්වළේ, කර්මාන්ත ශාලාවේ, වැඩ පොළේ හෝ වෙනත් යම් වෙළෙඳ හෝ කාර්මික ආයතනයේ තමා යටතේ හෝ භාරයේ සේවා නියුක්

තයන් පස් දෙනකු හෝ ඊට වැඩි ගණනක් සිටින බවට, එකී ආකරය, ගල්වළ, කර්මාන්ත ශාලාව, වැඩ පොළ හෝ වෙනත් යම් වෙළෙඳ හෝ කාර්මික ආයතනය පිහිටා ඇති දිස්ත්‍රික්කයේ ජනලේඛන අධිකාරිවරයාට හෝ කොමසාරිස්වරයාට නියමිත ආකෘතිය පරිදි වූ ප්‍රකාශයක් කළ යුතු ය. ඒ ප්‍රකාශය කරන ලෙස ඉල්ලා සිටිමින් දිස්ත්‍රික්කයේ හෝ ප්‍රදේශයේ ජනලේඛන අධිකාරිවරයා හෝ කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ සහ ප්‍රවෘත්ති පත්‍ර එකක හෝ වැඩි ගණනක දැන්වීමක් පළ කර දින දහහතරක් ඇතුළත දී කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් නියම කර ඇති පරිදි ප්‍රකාශයක් කරන සෑම තැනැත්තකුට ම අවශ්‍ය විස්තර පිරවීම සඳහා නියමිත ආකෘතිය පරිදි වූ උපලේඛනයක් හෝ උපලේඛන ලබා දීම හෝ ලැබීමට සැලැස්වීම අවස්ථාවෝචිත පරිදි, ජනලේඛන අධිකාරිවරයාගේ හෝ සෑම කොමසාරිස්වරයකුගේ ම කාර්ය විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ යම් උපලේඛනයක් භාර දෙනු ලැබ ඇති සෑම තැනැත්තකු ම ඒ සඳහා එහි විධිවිධාන සලසා ඇත් නම්, තමාට එකී උපලේඛන ලැබුණේ යම් තැනැත්තකුගෙන් ද ඒ තැනැත්තාට තත් කාර්ය සඳහා සපයන ලද ලදුපතක් අත්සන් කර යැවිය යුතු අතර සිය උපරිම දැනුම හා විශ්වාසය අනුව ජනලේඛනය ගනු ලබන අවසථාවේ දී තමා යටතේ හෝ භාරයේ පවතින එකී ආකරයේ, ගල්වළේ, කර්මාන්ත ශාලාවේ, වැඩ පොළේ හෝ වෙනත් යම් වෙළෙඳ හෝ කාර්මික ආයතනයේ සිටින සියළුම තැනැත්තන්ට අදාළ කාරණාවලින් එකී උපලේඛනය හෝ උපලේඛන පුරවා සිය නම එහි අත්සන් කර නියම කරනු ලැබූ විට එසේ පුරවා අත්සන් කරන ලද උපලේඛනය හෝ උපලේඛන එම ආකරය, ගල්වළ, කර්මාන්ත ශාලාව, වැඩ පොළ හෝ වෙනත් යම් වෙළෙඳ හෝ කාර්මික ආයතනය පිහිටා ඇති ප්‍රදේශය සඳහා පත් කර ඇති ගණන් ගන්නාට හෝ අධීක්ෂකට හෝ ජනලේඛන අධිකාරිවරයා නැත හොත් කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන වෙනත් තැනැත්තකුට හෝ ජනලේඛන අධිකාරිවරයා හෝ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන වෙනත් ක්‍රමයකින් හෝ භාර දෙනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**10.** 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"මේ ආඥාපනත යටතේ සපයා ඇති තොරතුරු ප්‍රසිද්ධ කළ යුතු ආකාරය ආදිය.

20අ. (1) මේ ආඥාපනතේ 20 වන වගන්තියේ කුමක් සඳහන් වුව ද මේ ආඥාපනත යටතේ පිළියෙළ කරන ලද කිසිම ප්‍රකාශනයක් යම් තැනැත්තකුට අදාළ යයි පෞද්ගලිකව හඳුනා ගැනීමට හැකිවන අන්දමේ තොරතුරක් හෙළිදරව් කිරීම හෝ හඳුනා ගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසීම හෝ නොකළ යුතු ය.

(2) මේ ආඥාපනත යටතේ සංඛ්‍යාලේඛන එකතු කිරීමේ හෝ පිළියෙල කිරීමේ යෙදී සිටින සෑම තැනැත්තකු ම මේ ආඥාපනතේ කාර්ය සඳහා හැරුණු විට මේ ආඥාපනත යටතේ සපයන ලද කිසිම තොරතුරක් අනාවරණය කිරීම හෝ එයින් ප්‍රයෝජන ගැනීම හෝ නොකරන බවට නියමිත ආකෘතිය අනුසාරයෙන් ප්‍රකාශයක් කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"දණ්ඩන.

21. (1) මේ ආඥාපනත යටතේ යම් ජනලේඛන යක කාර්ය සඳහා ජනලේඛන අධිකාරිවරයා විසින් හෝ ජනලේඛන කොමසාරිස්වරයකු විසින් සේවයේ යොදවා ගන්නා ලද යම් ජනලේඛන නිලධරයකු හෝ වෙනත් යම් තැනැත්තකු—

(අ) ප්‍රමාණවත් හේතුවක් නොමැතිව, අධිකාරිවරයා හෝ කොමසාරිස්වරයා හෝ ජනලේඛන අධිකාරිවරයා හෝ කොමසාරිස්වරයා වෙනුවෙන් වෙනත් යම් ජනලේඛන නිලධරයකු හෝ විසින් තමාට දෙන ලද උපදෙස් හෝ විධාන පිළිපැදීම ප්‍රතික්ෂේප කරතොත් හෝ නොසලකා හැරියහොත් හෝ තමා වෙත පවරන ලද රාජකාරිය නිසි උද්යෝගය සහ ප්‍රවේසම් සහිතව ඉටු කිරීම පැහැර හැරියහොත්; හෝ

(ආ) හිතාමතා ම අප්‍රසන්න හෝ අයථා ප්‍රශ්නයක් ඇසුවහොත් හෝ දැන දැනම යම් අසත්‍ය වාර්තාවක් සාදතොත්; හෝ

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 යි. (විදේශීය රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.